**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2021 පෙබරවාරි 17 කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන විධාන 2021 අංක 02**

**මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම**

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණ සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් වටිනාකම් මත ණය අනුපාත ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් විධාන නිකුත් කරනු ලබයි.

1. කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 03 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම සඳහා නිකුත් කරන ලද විධානයෙහි 1 (i) (ආ) විධානය පහත විධානය මඟින් ප්‍රතිස්ථාපනය කෙරේ.

    (ආ) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිත කරන ලද ලියාපදිංචි වාහන සඳහා අනුපාතය සියයට 80 ක් විය යුතුය.

**ජේ ඩී එස් ජේ නානායක්කාර**
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව